**රත්නපුර මහා නගර සභාව - 2020**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.2 (ඉ) සහ (උ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ එකතුව රු. 1,029,400 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 14,622,237 ක් වූ මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට නොහැකි වූ ඌන බිල් කිරීම නිවැරදි කරන බව. | ඌන බිල්කිරීම් සඳහා ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද කර්මාන්ත වල වටිනාකම රු. 9,593,039 ක් වුවද, රු. 10,624,704 ක් බිල්කිරීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන ආදායම හා වර්ෂය අවසාන දිනට හිඟහිටි ප්‍රාග්ධන ආදායම රු. 1,031,665 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ විමධ්‍යගත කර්මාන්ත සඳහා වැඩියෙන් සිදුකල බිල් කිරීම නිවැරදි කරන බව. | වර්ෂයට අදාල බිල්කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ආදායම් ශීර්ෂ 06 කට අදාලව එකතුව රු. 2,023,275 ක් ආදායම් බිල්කිරීම් සිදු නොකිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය හා වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ආදායම් වල අගය සමාන වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | ඌන බිල් කිරීම නිවැරදි කරන බව. | වර්ෂයට අදාල බිල්කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සළුසල ගොඩනැගිල්ල සඳහා බිල්කල යුතු ආදායම රු. 480,000 ක් වුවද, එය රු. 2,059,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 1,579,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පොදු ගිණුමේ ශේෂය සහ සාරාංශ මුදල් පොත අනුව ශේෂය අතර රු. 4,297,514 ක් වූ වෙනසට හේතු හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි. | මෙම තොරතුරු සොයා ගැනීමට අපහසු විය. තවදුරටත් කරුණු සොයා ඉදිරියට කටයුතු කරන බව. | ගිණුම් ශේෂයේ වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු සහ අනවසර සේවා ගාස්තු ආදායම් පිළිවෙලින් රු. 685,067 ක් සහ රු. 448,324 ක් තැන්පතු ගිණුමට බැර කර තිබීම හේතුවෙන් වෙනත් ආදායම් රු. 1,133,391 ක් අඩුවෙන් දැක්වුණි. ඉකුත් වර්ෂවල සිට සිදුව තිබූ මෙම දෝෂය හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ජංගම බැරකම් රු. 10,890,167 ක් වැඩියෙන් ද, සමුච්චිත අරමුදලේ ශේෂය සමාන වටිනාකමින් අඩුවෙන් ද දැක්වුණි. | 2021 අයවැය ලේඛනය අනුව පෙරසැරි ගාස්තු ආදායම 30341(iii) අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. 2021 අයවැය කිරිමේදී ඉහත උප ආදායම් විෂයය ඇතුලත් කොට සභා සම්මත කරගෙන ඇත. තවද අනවසර සේවා දඩ ගාස්තු ආදායම් ශීර්ෂයක් යටතේ ගිණුම්ගත කිරීමට 2020 වර්ෂයේ කටයුතු කර නොමැති අතර 2021 වර්ෂයේ ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගත් බව. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කමිටු දීමනා වශයෙන් ගෙවන ලද රු. 297,000 ක් වර්ෂයට අදාල වියදම් ලෙස හඳුනා නොගෙන පෙරසැරි ගාස්තු ගිණුම හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම රු. 297,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ දී සැලසුම් කමිටු දීමනා ගෙවීම සඳහා 31459 (10) ලෙස වැය ශීර්ෂය සටහන් කර ඇත. ඒ අනුව එම දෝෂය ඉදිරියේදී නිවැරදි කරන බව. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි සිට 2020 අගෝස්තු දක්වා කාලසීමාව තුළ අවස්ථා 38 කදී විධිමත් අනුමැතියකින් තොරව රෝගීන් ප්‍රවාහනයට හා වෙනත් අරමුණු සඳහන් කරමින් ගිලන් රථය කිලෝමීටර් 3639 ක් ධාවනය කර තිබුණු අතර, ධාවන සටහන් ලිවීමෙන් තොරව කිලෝමීටර් 2581 ක දුර ප්‍රමාණයක් එම රථය ධාවනය කර තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව ධාවනය කර ඇති අතර, ඒ සඳහා අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන බව හා ධාවන සටහන් පොතෙහි සටහන් කිරීමකින් තොරව ධාවනය කළ රියදුරන් හඳුනාගෙන ඔහුන්ගෙන් එම වියදම අයකර ගැනීමට කටයුතු කරන බව. | රජයේ දේපල අයථා ලෙස පරිහරණය සඳහා ඇති අවස්ථා වැළැක්වීමට කටයුතු කළ යුතු අතර, සිදුව ඇති අවභාවිතයට අදාල මුදල් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------------- | ----------------------- | ------------------------ | ---------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | 1965 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 9,384,988 ක් වූ ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පොදු තැම්පත් ගිණුමේ ආදායමට ගතයුතු ශේෂයන් ආදායමට ගැනීමටත් විවිධ තැම්පතු හැකිතාක් දුරට නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.7 වගන්තිය | නිල නිවාසයක් සඳහා 2011 මැයි 2020 ජූනි දක්වා නිලධාරීන් තිදෙනෙකුගෙන් රු. 330,000 ක් වූ නිවාස කුලී අයකර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5:7 වගන්තිය ප්‍රකාරව නිල නිවාස කුලී ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 89,516,436 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 120,052,443 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**---------------------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------- | --------------- |
| **(අ)** | **වරිපනම් හා බදු**<br>**-----------------**<br>2020 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 37,517,503 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සභාවේ පවතින මෘදුකාංග පද්ධතිය මඟින් හිඟ වරිපනම් ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණයක් ලබා දීමට සභාව අපොහොසත් වූ අතර, 1997 වර්ෂයේ වරිපනම් තක්සේරුව අනුව | වසංගත තත්ත්වය හමුවේ පසුගිය වර්ෂයේ බදු අයකිරීමේ ප්‍රතිශතය සියයට 67 ක් වැනි තත්ත්වයක පවත්වා ගැනීමට අපට හැකි වූ බවත්, වරිපනම් අංශයේ තිබෙන වසර 20 ක් පමණ පැරණි මෘදුකාංගය මඟින් වරිපනම් හිඟ ශේෂයන් කාල විශ්ලේෂණය කර | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| වරිපනම් අය කරමින් පැවතුණි. | ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව හා තක්සේරු කටයුතු සිදු කරමින් පවතින බව. | |

**(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 8,316,185 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2020 මැයි සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම හඳුනාගෙන නොතිබුණි. | වර්ෂයට අදාල මුද්දර ගාස්තු ගණනය කර ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් පවතින බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) පරිසර බලපත්‍ර**

| | | |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත සම්බන්ධයෙන් නීතිමය කටයුතු කළ යුතු වුවත්, පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 25 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම හා ආයතන 44 ක් බලපත්‍ර අලුත් නොකිරීම සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් සභාවට රු. 276,000 ක ආදායමක් අහිමි වී තිබුණු අතර එම කර්මාන්ත මඟින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් ද සිදුව නොතිබුණි. | පරිසර නිලධාරී පුරප්පාඩුව සම්පූර්ණ කර ඇති බැවින් නිසි ආකාරව පරිසර බලපත්‍ර ලබාදීම යතාවත් කිරීමට ක්‍රියාකරමින් පවතින බව. | ජාතික පරිසර පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේදී සභාව වෙත පවරාගෙන තිබූ ඉඩම් කැබලි 02 ක්, වෙනත් ඉඩම් සඳහා හුවමාරු කිරීම 2010 ජුනි 28 දින මහා සභා අනුමැතිය ලැබී තිබුණද, පැවරුම් පිඹුරුපත අනුව පර්චස් 147 ක් පමණක් පවරා ගෙන තිබුණි. ඉඩම් හුවමාරුවට සම්බන්ධ පුද්ගලයින් දෙදෙනා විසින් මෙම ඉඩමට යාබද ඉඩමෙහි මහල් 06 කින් යුත් අනවසර ගොඩනැගිල්ලක් ඉදිකරමින් තිබුණු අතර, එහි බිම් කට්ටි සැලැස්ම 2007 වසරේදී රජයට පවරාගත් පර්චස් 67 ක ප්‍රමාණයක් ඇතුලත්වන පරිදි මහා නගර සභාව විසින් අනුමත කර තිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් භූමි යෝග්‍යතා සහතිකයක් 2013 අප්‍රේල් 04 දින ලබා දී තිබුණද, භූගත මහල සමඟ මහල් 06 ක ගොඩනැගිල්ලක ව්‍යුහාත්මක ඉදිකිරීම් සිදුකර ඇති බැවින් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් තවදුරටත් සිදුකරයි නම් මිහිවිදුම් පරීක්ෂාවක් කර සැලසුම් පරාමිතීන් තහවුරු කරගත යුතු බවට කොන්දේසි පනවා තිබුණි. එසේ වුවද, මෙම කොන්දේසි නොසලකා සභාව විසින් සංවර්ධන බලපත්‍රය නිකුත් කර තිබුණි. උක්ත ගොඩනැගිල්ලට අදාලව අනවසර සේවා ගාස්තු වශයෙන් රු. 8,830,000 ක් අයකල යුතු වුවද, ඒ සඳහා සභාව විසින් රු. 100,000 ක් පමණක් අයකර තිබුණි. | නැවත මායිම් විවෘත කර මැනුමක් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීමක් සිදුකර ඇතත්, මේ වන තෙක් එය සිදුවී නොමැති බවත්, අනුමැතිය ලබාදී ඇති සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී මැනුම් සභාවට පැමිණිලි කරන බව හා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ විසින් මෙම ගොඩනැගිලි සැලසුම් අනුමැතිය සඳහා නිර්දේශ කර ඇති බව හා අයකර ගතයුතු දඩ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොමැති බව. | සභාවට හිමිවිය යුතු ඉඩම් කොටස ලබාගෙන අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු අතර, සංවර්ධන අවසරපත් නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම, බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේදී නිලධාරීන් නොසැලකිල්ලෙන් කටයුතු කිරීම පිළිබඳව සොයා බැලීම, සභාවට ලැබිය යුතු ආදායම් නිසි පරිදි අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) | බාහිර පාර්ශව විසින් ඉදිකර තිබුණු ගොඩනැගිලි 03 ක් සඳහා වන ඉඩම්වල බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේදී සභාවට අයත් භූමියෙන් කොටසක් ද ඇතුලත් වන පරිදි මහා නගර සභාව විසින් 2017 අගෝස්තු 02 දින එම කට්ටි සැලසුම් අනුමත කර තිබුණි. එහිදී අනවසරකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම ගැටළුකාරී වී තිබුණු අතර, එම බිම් කොටස් අදාල පාර්ශව වෙතම බිම්බදු පදනමට ලබා දීමට 2019 ඔක්තෝබර් 08 දින සභාව තීරණය කර තිබුණි. එසේ වුවද, සභාවට අයත් භූමිය ඇතුලත් වන පරිදි බාහිර පාර්ශව වෙත බිම් කට්ටි සැලසුම් අනුමත කර දීම සම්බන්ධයෙන් වගකිව යුතු අයට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූලව කටයුතු කිරීමට ඉදිරියේදී ක්‍රියා කරන බව. | නගර සභාවේ දේපල අවභාවිතයට ඉඩසැලසීම සම්බන්ධයෙන් සැලසුම් කමිටු සාමාජිකයින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභාවට අයත් කණාදොල කොම්පෝස්ට් අංගනයේ අකුණු සන්නායක සවිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා විසින් අන්තර්ජාලය ආශ්‍රයෙන් හඳුනාගත් ආයතන 05 නම්කර ලංසු කැඳවා තිබුණි. තාක්ෂණික කමිටු නිර්දේශ අනුව වැට් බදු සහිතව රු. 990,525 ක වටිනාකමකට ප්‍රසම්පාදන පිරිනමා තිබූ ආයතනය හැර සෙසු ආයතන අකුණු සන්නායක සැපයීම සිදු කරන ආයතන නොවන බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව ප්‍රසම්පාදනය පිරිනැමීමේ අරමුණින් මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් හා අකුණු සන්නායක සැපයීම් නොකරන වෙනත් ආයතන 04 කින් ලංසු කැඳවීම කර ටෙන්ඩරය පිරිනමා තිබුණි. | අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවීම සිදුකලද, එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කළ බවත්, මිලදී ගැනීම හේතුවෙන් සභාවට අලාභ සිදු නොවූ බව. | භාණ්ඩ මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සාධාරණ තරඟයකට ලක්කර සුදුසු ටෙන්ඩර්කරු තෝරා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 16,200 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 17,766,972 ක පිරිවැයක්, කාර්යය මණ්ඩල සේවකයින් 160 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර උපකරණ 21 ක් ද යොදවා තිබුණි. එකතුකරන කසළවලින් සියයට 65 ත් 62 ත් අතර ප්‍රමාණයක් කොම්පෝස්ට් සැකසීමට යෙදවීමෙන් පසුව ඉතිරි කසළ සියයට 35 ත් 38 ත් අතර ප්‍රමාණයද, සායනික නොවන රෝහල් අපද්‍රව්‍ය මසකට ට්‍රැක්ටර් ලෝඩ් 27 ක් පමණද, මස්, මාළු වෙළඳසැල් වලින් ඉවත්කරන කසළ ප්‍රමාණයද ඇතුළත්ව සැලකිය යුතු කසළ ප්‍රමාණයක් විධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව විවෘත පරිසරයට බැහැර කිරීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | එම මධ්‍යස්ථානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාදාමය අඛණ්ඩව මෙන්ම මානව ක්‍රියාකාරකම් බැඳුනු ක්‍රියාවලියක් බැවින් හැකි සෑම විටම උපරිම කාර්යක්ෂමව ගෙනඒමේ උත්සාහයක යෙදෙමින් පවතින බව. | කසළ විවෘත පරිසරයට බැහැර කිරීම මඟින් සිදුවන පාරිසරික හානිය අවම කළ යුතුය. |